15

# අල් කුර්ආනය පහළ කිරීම හා ගොනු කිරීම

**ගුරුවරයා :-**

අල් කුර්ආනය පිළිබඳ සංවාදයක් පැවැත්වීමට නියමිත ය. මෙහි දී පිරිසක් සහභාගීවන්නන් ලෙස ද, පිරිසක් නරඹන්නන් ලෙස ද සිටිති. සංවාදය නෂාත් සිසුවා ආරම්භ කරයි.

**නෂාත් :-**

අල් කුර්ආනය පහළ කිරීම හා ගොනු කිරීම යන මාතෘකාව යටතේ, අල් කුර්ආනය ප්‍රථම වරට පහළ වූ ආකාරය පිළිබඳ ව ඔබ සමග අදහස් හුවමාරු කර ගැනීමට ඉදිරිපත් වූයෙමි.

අල්ලාහු තආලා විසින් පහළ කරන ලද ආගම් සතරක් ඇති බව අපි දනිමු. එයින් අල් කුර්ආනය අවසන් වරට මුහම්මද් නබි (සල්) තුමාණන්ට පහළ කරන ලද ආගම වේ. මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ හතලිස් වන වියෙහි (ක්‍රි:ව 610 දී පමණ) මක්කාවේ පිහිටි හීරා ගුහාවේ තනි ව සිටි අවස්ථාවේ ලෛලතුල් කද්ර් නම් රාත්‍රියේ ප්‍රථම වහීය පහළ විය.



වහී රැගෙන එන මලක්වරයා වන ජිබ්රීල් (අලෛ) තුමා, එතුමාණන් වෙතට පැමිණ "ඉක්රඃ" (කියවන්න) යැයි පැවසුවේ ය. එතුමාණෝ "මම කියවීමට නොදන්නෙමි" යනුවෙන් පැවසූහ. එවිට ජිබ්රීල් (අලෛ) තුමා මුහම්මද් නබි (සල්) තුමාණන් ව තදින් වැළඳ ගත්තේ ය. පසු ව අතහැර "ඉක්රඃ" යනුවෙන් නැවත වරක් පැවසුවේ ය. එවිට ද "මම කියවීමට නොදන්නෙමි" යනුවෙන් ම පිළිතුරු දුන්හ. ජිබ්රීල් (අලෛ) තුමා නැවත වරක් තදින් වැළඳ ගෙන "ඉක්රා" යැයි පැවසුවේ ය. මෙලෙස තෙවරක් ම සිදු වූ පසු "කුමක් පාරායනය කරන්න ද?" යැයි විමසූහ. එවිට 'සූරතුල් අලක්' හි ප්‍රථම වාක්‍ය පහ පාරායනය කර පෙන්වූයේ ය. මුහම්මද් නබි (සල්) තුමාණෝ එය කටපාඩම් කර ගත්හ.

මෙය මුහම්මද් නබි (සල්) තුමාණන් හට එක් අලුත් අත්දැකීමක් විය. එබැවින් එතුමාණන් හට තැතිගැන්මක් හා බියක් ඇති විය. නිවස කරා ගොස් "මාව පොරවන්න, මාව පොරවන්න" යැයි පැවසූහ. බිරිඳ වන කදීජා (රළි) තුමිය එතුමාණන් පෙරවූවා ය; සැනසුවා ය. පසු ව සිදු වූ දේ විමසා ධෛර්යවත් කළා ය. පෙර ආගම් පිළිබඳ දැනුමක් ඇති තම ඥාතියකු වූ වරකත් බින් නව්ෆල් තුමා වෙතට කැඳවා ගෙන ගියා ය. එතුමා "මුහම්මද් (සල්) තුමාණන් අල්ලාහ්ගේ ධර්ම දූතයකු ලෙස පහළ කර ඇති බව ද, මුහම්මද් නබි (සල්) තුමා වෙතට පැමිණියේ ජිබ්රීල් (අලෛ) නම් දේව දූතයා" බව ද පැහැදිලි කළේ ය.

**නුස්හී** :-

නෂාත් සහෝදරයා පළමු වහී පහළ වීම පිළිබඳ පැහැදිලි කළේ ය. ඒ සමග විවිධ අවස්ථා හා අවශ්‍යතාවලට අනුව අල් කුර්ආන් වාක්‍යය පහළ විය. ජිබ්රීල් (අලෛ) තුමා අල් කුර්ආන් වාක්‍යයන් දැනුවත් කරන විට මුහම්මද් නබි (සල්) තුමාණෝ ඒවා වනපොත් කර ගත්හ. එසේ ම ලිඛිත දැනුම ඇති තම මිතුරන්ගෙන් ලිඛිත ව තබා ගන්නා ලෙස ආයාචනා කළහ. එලෙස වහී සටහන් කරන්නෝ "කුත්තාබුල් වහී" යයි අමතනු ලැබූහ. එකල මක්කාවේ කියවීමට හා ලිවීමට දන්නා ඉතා සුළු පිරිසක් පමණක් සිටියහ. එසේම ලේඛනය සඳහා අවශ්‍ය උපකරණ ද තිබුණේ ඉතා අල්ප වශයෙනි. එබැවින් ඔවුහු සම්, සනඇට සැකිලි, සුදු ගල් යනා දී ද්‍රව්‍යයන්හි ලියා තැබූහ.

අල් කුර්ආන් වාක්‍යයන් අවස්ථාවන්ට අනුව පහළ වූ බැවින් ඒවා තනි වාක්‍යයක් ලෙස ද, වාක්‍ය කිහිපයක් ලෙස ද, සූරාවක් ලෙස ද පහළ විය. එවිට අලුතින් පහළ කරන ලද ආයත් හෝ සූරා, පෙර පහළ වූ කුමන ආයතයක හෝ සූරාවට පෙර ද පසු ද පිහිටිය යුත්තේ ද යන විස්තරය ජිබ්රීල් (අලෛ) තුමා දැනුම් දුන්නේ ය. එය ද සටහන් කර ගන්නා ලෙසට මුහම්මද් නබි (සල්) තුමාණෝ 'කුත්තාබුල් වහී' වරුන් වෙත දන්වා සිටියහ.

අල් කුර්ආනය පියවරින් පියවර පහළ වූ පිළිවෙළ 'තර්තීබුන් නුසූල්' යනුවෙන් ද, අල් කුර්ආනය පාරායනය කිරීම සඳහා නබි මුහම්මද් (සල්) තුමාණන් පෙන්වා දුන් පිළිවෙළ 'තර්තීබුත් තිලාවත්' යනුවෙන් ද හඳුන්වනු ලැබේ. අල් කුර්ආනය මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ වෆාතය දක්වා ම පහළ විය.

**නස්මියා :-**

නුස්හී සහෝදරයා මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ කාලයේ අල් කුර්ආනය පහළ වූ ආකාරය පෙන්නුම් කළේ ය. බොහෝ විට අරාබිවරුන් අතර ඉතා ඉහළ මතක ශක්තියක් තිබුණි. එය එම සමාජයට හිමි වූ විශේෂත්වයකි. එම නිසා සහාබිවරු අල් කුර්ආනය ඉතා පහසුවෙන් වනපොත් කර ගත්හ. එසේ ම "කුත්තාබුල් වහී" යනුවෙන් නම් කළ අය හා තවත් සමහරු අල් කුර්ආනය වන පොත් කරන අතර ම, ලියා ගනිමින් ද සිටියහ. කෙසේ වෙතත් මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ කාලයේ අල් කුර්ආනය ග්‍රන්ථාරූඪ නොවී ය.

නමුත් සෑම රමළාන් මාසයක ම එතෙක් පහළ කරන ලද වාක්‍යයන් ජිබ්රීල් (අලෛ) තුමාණන් පාරායනය කර පෙන්වන විට මුහම්මද් නබි (සල්) තුමාණෝ තම මතකය පරීක්ෂා කර ගත්හ. මෙලෙස මුහම්මද් නබි (සල්) තුමාණන් ගේ වෆාතයට පෙර වූ මාසයේ දී (රමළාන්) දෙවතාවක් පරීක්ෂා කරගත්හ. එවිට එතුමා සයිද් ඉබ්නු සාබිත් (රළි) තුමා සමග සිට එයට සවන් දුන්නේ ය.

**සබ්රිනා :-**

මුහම්මද් නබි (සල්) තුමාණන් අල් කුර්ආනය ගොනු කිරීමට පෙර සූදානමක් සකස් කර තිබෙන්නේ ද, යන්න නස්මියා සහෝදරිය පෙන්නුම් කළා ය. මුහම්මද් නබි (සල්) තුමාණන් වෆාත් වී අබූබක්කර් (රළි) තුමාණන් කලීෆා ලෙස පදවි ප්‍රාප්ත වූ විට මුතනබ්බිවරු ද (ව්‍යාජ නබිවරුන්) මුර්තද්වරුන් ද (ඉස්ලාමය අතහැර ගිය අය) කලබල ඇති කරන්නට වු බැවින් ඔවුන්ට විරුද්ධ ව යමාමා නම් ස්ථානයේ සටනක් සිදු විය. එහි දී අල් කුර්ආනය වන පොත් කළ හාෆිල්වරු අධික ලෙස ෂහීද් වූහ. මේ නිසා අල් කුර්ආනය නැති වී යයි දෝ යන බිය උමර් (රළි) තුමාණන්හට ඇති විය. එතුමා කලීෆා තුමාට අල් කුර්ආනය ගොනු කර ලිඛිත ව තබා ගත යුතු යැයි, උපදෙස් දුන්නේ ය. කලීෆා තුමා ද එය මුහම්මද් නබි (සල්) තුමාණන් සිදු නොකළ ක්‍රියාවක් යැයි පවසා ප්‍රථමයෙන් පසුබට වූයේ ය. නමුත් තත්ත්වය අවබෝධ කරගෙන එයට එකඟ වුණේ ය. එම වගකීම z සයිද් ඉබ්නු සාබිත් (රළි) තුමාගේ නායකත්වයෙන් යුත් කමිටුවකට පවරන ලදි. ඔහු ද ආරම්භයේ දී පසුබට වී පසු ව වගකීමෙන් යුතු ව ක්‍රියා කර එම සේවය ඉටු කළේ ය.



එතුමා මස්ජිදුන් නබවියේ දොරටුවේ දෙදෙනකු රඳවා, මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ කාලයේ ලියන ලද තමන් අතර ඇති කුර්ආන් පාඨ ලියූ ද්‍රව්‍යය ගෙනැවිත් සාක්ෂි සහිත ව භාර දෙන ලෙස දැනුම් දුන්නේ ය. එලෙස ගෙන එන ලද ද්‍රව්‍ය සියුම් ලෙස අධ්‍යයනයට ලක් කළේ ය. එම කමිටුව ඒවා පරීක්ෂා කළහ. කඩදාසිවල ලියා කලීෆා තුමා වෙත භාර දුන්හ. කලීෆා තුමා එය "මුස්හෆ්" යනුවෙන් නම් කළේ ය. එය ආරම්භ කාලයේ කලීෆා අබුබක්කර් (රළි) තුමා භාරයේ තබා, පසු ව එතුමාගේ වෆාතයෙන් පසු කලීෆා උමර් (රළි) වෙත භාර කරන ලදි. උමර් (රළි) තුමා එය තම දියණිය වන හා මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ බිරිඳ වන හෆ්සා (රළි) තුමිය වෙත භාර කළේ ය.

නදාරා :-

අල් කුර්ආනය ගොනු කිරීමේ ඊළඟ පියවර, කලීෆා උස්මාන් (රළි) තුමාගේ කාලයේ සිදු විය. එතුමාගේ කාලයේ ආර්මේනියා, අසර්බයිජාන් යන ප්‍රදේශවල මුස්ලිම් ජාතිකයෝ සටන්වල නිරත වෙමින් සිටියහ. සේනාව ඉරාකයේ හා ෂාම් දේශයේ සිටියහ. ඔවුහු අල් කුර්ආනය පාරායනය කරන විට විවිධාකාරයෙන් පාරායනය කළහ. එපමණක් නොව තම පාරායනය රටාව නිවැරදි යයි තර්ක කළහ. මෙය හුදෙයිෆා අල් යමානි (රළි) තුමා අවධාරණය කළේ ය. යුද්ධය අවසන් වී මදීනාවට ගිය වහා ම අල් කුර්ආනයේ නමින් මුස්ලිම්වරුන් භේද නොවිය යුතු ය, යන අදහස ඉදිරිපත් කර සටනේ දී සිදු වූ දේ කලීෆා තුමාට ගෙනහැර දැක්වූයේ ය. ෂාම්දේශවාසීන් හා ඉරාක දේශවාසීන් එක ම අල් කුර්ආනය වෙනස් ආකාරයෙන් පාරායනය කිරීමට හේතුව කුමක් ද, යන පැනය ඔබට සිතෙන්නට පුළුවන. එකල එක් එක් ගෝත්‍රිකයෝ එකිනෙකට වෙනස් වූ අරාබි භාෂාවලට පුරුදු වී සිටියහ. එම නිසා එම භාෂා ව්‍යවහාරයේ උච්චාරණය විවිධ විය. එහෙත් අර්ථය විවිධ නොවී ය. එබැවින් මුහම්මද් නබි (සල්) තුමාණෝ තම තමන්ගේ භාෂා ව්‍යවහාරය අනුව අල් කුර්ආනය පාරායනය කිරීමට අනුමැතිය ලබා දුන්හ. පසු කාලයේ ඉස්ලාමය ව්‍යාප්ත වන විට එම ප්‍රදේශවලට අල් කුර්ආනය ඉගැන්වීම සඳහා සහාබිවරුන් යැවූහ. ඔවුහු ද තම තමන්ගේ භාෂා ව්‍යවහාරයට අනුව ම එම ජනතාවට කියා දුන්නෝ ය. එම නිසා ප්‍රදේශ අතර පාරායනය ක්‍රමය තුළ වෙනස්කම් ඇති විය.

උමයිර් :-

හුදෙයිෆා අල්යමානි (රළි) තුමාගේ පැමිණිල්ලට සවන් දුන් කලීෆා තුමා වහා ම ක්‍රියාත්මක විය. සයිද් බින් සාබිත් (රළි) තුමාගේ නායකත්වය යටතේ කුරෛයිෂි වරුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කළේ ය. කලීෆා තුමා ඔවුන්ගෙන් කුරෛයිෂිවරුන්ගේ ව්‍යවහාර භාෂාවට අනුව අල් කුර්ආනය පිටපත් කරන ලෙස ඉල්ලා සිටියේ ය. ඔවුහු අබු බක්කර් (රළි) තුමාගේ කාලයේ මුස්හෆ් ද, කුරෛයිෂිවරුන්ගේ භාෂා ව්‍යවහාරය ද අවධානයට ලක් කරමින් පිටපත් අටක් සකස් කළහ. ඒවා එක් එක් පළාත්වලට යවනු ලැබුණි. එම පිටපත් සමග කුරෛයිෂිවරුන්ගේ ව්‍යවහාරයට පාරායනය කළ හැකි කාරිවරුන් ද යැව්වේ ය. ඒ සමග ම "මින් පසු එම කාරිවරුන් සේ ම පාරායනය කළ යුතු ය, යන්නත් එවන ලද පිටපත බලා ලියා ගත යුතු ය, යන්නත් (පෙර තිබුණු) අනෙක් පිටපත් සියල්ල ගිනිබත් කළ

යුතු ය" යන්නත් අණ කළේ ය. මේ නිසා සියලු දෙනා ම අල් කුර්ආනය එක ම ආකාරයට පාරායනය කරන තත්ත්වයක් ඇති විය. එම නිසා උස්මාන් (රළි) තුමා 'ජාමිඋල් කුර්ආන්' යනුවෙන් හඳුන්වනු ලැබුණි. එතුමාගේ කාලයේ අල් කුර්ආන් පිටපත 'මුස්හෆ් උස්මානි' යනුවෙන් හඳුන්වනු ලැබී ය.

ගුරුවරයා :-

මෙතෙක් වෙලා සවන් දුන් සංවාදය තුළින් ඔබ අල් කුර්ආනය පහළ කරන ලද හා ගොනු කරන ලද ආකාරය පිළිබඳ වටහා ගන්න ඇති. මේ පිළිබඳ අල්ලාහු තආලා පවසා ඇති දේ ද දැන ගත යුතු ය.

"නියතවශයෙන් ම සිහිපත් කිරීම (අල් කුර්ආන්) පහළ කළේ අප ය. නියත වශයෙන් ම එය ආරක්ෂා කරන්නෝ අපි ම ය." (15:09)

මේ පිළිබඳ ව වෙනත් විස්තර අවශ්‍ය නම් විමසන්න. සහභාගී වූ සියලු දෙනාට ම ස්තුතියි. ජzසාකල්ලාහු කෛරා

**අභ්‍යාස**

01. පහත අරාබි පදවල සිංහල අර්ථය ලියා දක්වන්න.
    1. සූරා
    2. ආයත්
    3. මුස්හෆ් උස්මානි
    4. කුත්තාබුල් වහී
    5. ඉක්රඃ
    6. තර්තීබුන් නුzසූල්
    7. කාරී කුර්රා
    8. මුර්තද්
    9. මුතනබ්බි
    10. වහී මත්ලුව්

02. මුහම්මද් (සල්) තුමාට ප්‍රථම වහී පහළ වීමේ සිදුවීම ලියා දක්වන්න.

03. අබූ බක්කර් (රළි) තුමාගේ කාලයේ දී අල් කුර්ආනය ගොනු කිරීමට හේතුව විස්තර කරන්න.

04. උස්මාන් (රළි) තුමාව "ජාමිඋල් කුර්ආන්" යන නාමයෙන් ඇමතීමට හේතුව විස්තර කරන්න.

05. අල් කුර්ආනය ගොනු කිරීමෙහි ලා සයිද් ඉබ්නු සාබිත් (රළි) තුමාගේ දායකත්වය විස්තරාත්මක ව ලියා දක්වන්න.